ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

**"ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ ඉන්දියාවට විවෘත කිරීමට සූදානම්", නව දිල්ලියේ පැවති ඉන්දියා - ශ්‍රී ලංකා ව්‍යාපාරික හමුවේදී ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ප්‍රකාශ කරයි**

ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ නිල ඉන්දීය සංචාරය අතරතුර 2024 දෙසැම්බර් 16 වන දින නව දිල්ලියේ දී ඉන්දියා - ශ්‍රී ලංකා ව්‍යාපාරික හමුවක් පැවති අතර ජනාධිපති දිසානායක මහතා සහ ඉන්දීය රජයේ වාණිජ සහ කර්මාන්ත අමාත්‍ය පියූෂ් ගෝයල් මහතා එම හමුව ඇමතූහ.

මෙම හමුව අමතමින් ජනාධිපති දිසානායක මහතා ප්‍රකාශ කළේ ව්‍යාපාරයන්ට හිතකර කාර්යක්ෂම පරිසරයක් ශ්‍රී ලංකාවේ නිර්මාණය කරන බව සහ ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ ඉන්දියාවට විවෘත කිරීමට සූදානම් බවයි. ඉදිරි වසර වලදී ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම නව රජයේ ප්‍රමුඛතාවයක් වන බව එතුමා සඳහන් කළේය. එසේම, ශ්‍රී ලංකාව විශේෂයෙන්ම සූර්ය සහ සුළං බලය ඇතුළු පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය තුළ ආයෝජන සාදරයෙන් පිළිගන්නා බව එතුමා පැවසූ අතර ශ්‍රී ලංකාවේ විදුලි පිරිවැය අඩු කිරීම සඳහා  බලශක්ති පරිභෝජනයේදී පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහළ නැංවීමට අපේක්ෂා කරන බව සඳහන් කළේය. තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය තුළ ඉන්දියාවේ ශක්තිය පිළිබඳ අදහස් දක්වමින් දිසානායක ජනාධිපතිතුමා සඳහන් කළේ ඩිජිටල් ආර්ථිකය මෙම දශකය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ අවධානයක් යොමු වන ක්ෂේත්‍රයක් බවයි. ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය තුළ ආයෝජනය කරන ලෙස එතුමා ඉන්දීය ආයෝජකයන්ට ආරාධනා කළේය.

ඉන්දීය රජයේ වාණිජ සහ කර්මාන්ත අමාත්‍ය පියූෂ් ගෝයල් මහතා ඉන්දියාවේ අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තිය තුළ ශ්‍රී ලංකාවට විශේෂ ස්ථානයක් හිමි වන බව ද ඉන්දියාව දෙරටෙහිම පොදු සෞභාග්‍යය උදෙසා ශ්‍රී ලංකාව සමඟ උරෙනුර ගැටී කටයුතු කරනු ඇති බව ද සඳහන් කළේය. සංචාරක ක්ෂේත්‍රය දෙරටට සහයෝගීතාවයෙන් කටයුතු කළ හැකි අංශයක් බව එතුමා ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය පුළුල් කිරීමෙහිලා ඉන්දියාවට කාර්යභාරයක් ඉටු කළ හැකි බව ප්‍රකාශ කළ එතුමා එලෙසම ඉන්දියාවේ පුනර්ජනනීය

බලශක්ති ගමනෙහි කොටසක් වන ලෙස ශ්‍රී ලංකාවට ආරාධනා කළේය. එසේම, ඖෂධ, තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය සහ සිනමා කර්මාන්තය ශ්‍රී ලංකාව සහ ඉන්දියාව සඳහා සහයෝගීතාවය ගොඩනඟා ගත හැකි ක්ෂේත්‍ර බව එතුමා සඳහන් කළේය. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සහයෝගීතාවය සඳහා ඉන්දියාව සූදානම් බව ද ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ස්ථාපනය කිරීම සඳහා ඉන්දියාව කැමැත්තෙන් පසුවන බව එතුමා ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල සහ වෛද්‍ය සහ ඉංජිනේරු විද්‍යාලයන්ට ඉන්දියාවේ විශ්ව විද්‍යාල ස්ථාපනය කරන ලෙස එතුමා ආරාධනා කළේය.

ඉන්දියාවේ සියලු ප්‍රදේශයන්ගෙන් සංචාරක කර්මාන්තය, යටිතල පහසුකම්, බලශක්තිය, ඖෂධ, නිෂ්පාදන, දුම්රිය සහ මූල්‍ය ඇතුළු විවිධ ප්‍රධාන ක්ෂේත්‍ර නියෝජනය කරමින් කර්මාන්ත අංශයෙහි ප්‍රමුඛයන් 30 දෙනෙක් මෙම ව්‍යාපාරික හමුව සඳහා සහභාගී වූහ.  එවැනි ප්‍රමුඛයන් රැසක් මේ සඳහා සහභාගී වීම තුළින් වර්ධනය බලගැන්වීම, නව්‍යකරණය ප්‍රවර්ධනය සහ විවිධ කර්මාන්තයන්හි හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම සඳහා සහයෝගීතාවය, සංවාද සහ අදහස් හුවමාරු කරගැනීම උදෙසා වේදිකාවක් වශයෙන් ව්‍යාපාරික හමුවේ වැදගත්කම අවධාරණය කරයි. විවිධ ක්ෂේත්‍රයන්හි පුළුල් නියෝජනය ඉන්දියාවේ ආර්ථිකය සහ එහි අනාගත සංවර්ධනය හැඩගැස්වීමෙහිලා එක් එක් කර්මාන්තයෙහි තීරණාත්මක භූමිකාව ඉස්මතු කළේය.

***

කොළඹ

*2024 දෙසැම්බර් 17*